සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# සිසු සවිය 2022
## 05 වන ශ්‍රේණියේ දූ පුතුන්ට අත්වැලක්

**පස්වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය**
**සබරගමු පළාත**

## II පත්‍රය

පැය 01 විනාඩි 15

විභාග අංකය : ..............................................................................................................

**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි....**

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

| | |
|---|---|
| I පත්‍රය ලකුණු | : |
| II පත්‍රය ලකුණු | : |
| මුළු ලකුණු | : |

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 61 ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**

# විශේෂ අවධානය පිණිස ...

පාසල්වල විදුහල්පතිවරු පංතිභාර ගුරු මහත්ම/මහත්මීන් වෙත...

- **2022/07/19 අඟහරුවාදා පාසලේදී හෝ නිවසේදී පහසු ආකාරයට සිසුන් ට ලියන්න අවස්ථාව ලබාදෙන්න**
- ගැටලුවක් ඇතොත් කොට්ඨාසයේ ප්‍රාථමික ගුරු උපදේශක, කලාප විෂය අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශය අමතන්න.
- පිළිතුරු පත්‍රය කලාප කාර්යාලය මගින් ඔබට ලබාගත හැකිය.
- වෙනත් පළාතක, කලාපයක දරුවෙකුට වුවද මෙය ලබාදීමට කටයුතු කරන්න.
- සේ සඳහා ඔබ දක්වන සහයෝගය අගය කරමි.

**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය**

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන ආකෘතියට අනුව ලකුණු විශ්ලේෂණ වාර්තා සකස් කළ යුතුය.

| I පත්‍රය | II පත්‍රය |
|---|---|
| පැය 01 යි | පැය 01 යි මිනිත්තු 15 යි |

- ලකුණු විශ්ලේෂණ වාර්තා අනුව දරුවන් සඳහා ප්‍රතිපෝෂණ සිදුකළ යුතුය.
- මෙදිනට කිරීමට අපහසුවන දරුවන් සඳහා ද මෙය පසු දිනක කළ හැකි බව ද දන්වමි.
- ඉතාමත් සතුටින් හා විනෝදයෙන් මෙම ප්‍රශ්න පත්‍රය ලිවීමට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය**

01. **පහත සඳහන් ඡේදය හොඳින් කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**<u>මාමා සෙල්ලම් කඩයක් සාදා දුන්නේ ය.</u>** සඳලි පතෝල ගෙනාවා ය. තාරුක ඉන්නල ගෙනාවේ ය. ඕවියා කංකුං ගෙනාවා ය. චරිත් ගස්ලබු ගෙනාවේ ය. කීදන් තාරාදියක් එල්ලුවේය. සියල්ලෝ ම එක් වී කඩයක් දැමුවෝ ය.

1. මාමා සාදා දුන්නේ කුමක් ද? ........................................................................................
2. පතෝල සහ කංකුං ගෙනාව අය පිළිවෙළින් ලියන්න. .......................................................
3. ප**තෝ**ල ඉරි ඇඳි අක්ෂරයේ පිල්ලම් ලියන්න. ......................................................................
4. අතීතකාල බහුවචන ක්‍රියා පදයක් ඡේදයෙන් සොයා ලියන්න. ...............................................
5. සඤ්ඤක අක්ෂරයක් සහිත වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. ...................................
6. ඡේදයේ ඉරි ඇඳි වාක්‍ය බහුවචනයට හරවා ලියන්න.

   .......................................................................................................................................

02. **දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.**

රළ / ළමයි / ඔබ / දුවති/මොබ / පාගමින් / වෙරළේ

...................................................................................................................................................

03. **පහත සඳහන් එක් එක් වගන්තිවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

1. අක්කා කවියක් ලිව්වා ය. (      )
2. නංගිලා කතන්දර ඇසුවේ ය. (      )
3. ඔවුහු ඉවසීමෙන් කටයුතු කරති. (      )
4. මම ගීත ගායනා කරමු. (      )

04. **සුදුසු විරාම ලකුණු යොදන්න.**

ඔයාලා කැමති එහෙම ද මුල් ගුරුතුමා විමසුවේ ය

05. 1. **පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.**

   ආඬි හත්දෙනාගේ ........................................................ වගේ.

   2. **පහත සඳහන් ප්‍රස්තා පිරුළට ගැළපෙන අදහස ලියන්න.**

   මඩේ හිටවපු ඉන්න වගේ.

   .......................................................................................................................................

06. **පහත ඉඟි වැකියට ගැළපෙන අදහස ලියන්න.**

මොර සූරන වැස්ස

...................................................................................................................................................

07. **අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

1. වළාකුලු , වලාකුළු , වළාකුළු
2. ගැහැනු ළමයි , ගැහැණු ළමයි , ගැහැණු ලමයි
3. විෂිශ්ඨ , විශිෂ්ඨ , විශිෂ්ට

**08.** **පහත සඳහන් වාක්‍ය බහු වචනයට හරවා ලියන්න.**

1. සිංහයා කැලෑවේ ජීවත් වෙයි.

   ........................................................................................................................

**09.** **ස්ත්‍රී ලිංග නාම පදය ලියන්න.**

නළුවා - ..........................................................................

**10.** **ඉරි ඇඳි පදයට සමානාර්ථ පදයක් ලියන්න.**

1. <u>කුරුල්ලා</u> අහසේ පියාසර කරයි.

   ........................................................................................................................

**11.** **සුදුසු යුගල පදය ලියන්න.**

1. කෙළි ..............................................
2. තැගි ..............................................

**12.** **පහත සඳහන් වගන්තිය ලිඛිත බසට හරවා ලියන්න.**

1. මල්ලී පාඩම් කළා. - ........................................................................................................
2. අපි ලස්සනට නටනවා. - ........................................................................................................

(ලකුණු 26)

**13.** **එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ලියන්න.**





............................................................ ............................................................

**14.** **පහත වාක්‍ය නිවැරදිව ගළපා ලියන්න.**

1. legs / I / have / four - ……………………………………………………..
2. my / This / brother / is - ……………………………………………………..

**15.** **පහත දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

1. This ………………… (is / are) my school.
2. He ……………… (have / has) blue shirt.

**16.** **පහත සඳහන් වාක්‍යවලට ගැළපෙන දෙමළ වාක්‍ය සිංහල අකුරෙන් ලියන්න.**

**මට වතුර එපා** - ........................................................................................................

**17.** **පහත සඳහන් දෙමළ වැකියේ අර්ථය සිංහලෙන් ලියන්න.**

**උංගළ් පෙයර් එන්න ? -** ........................................................................................................

**18.** '' මම කුඩුවක සිරවී සිටින ගිරවෙක් වෙමි'' යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක්ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

1. ..............................................................................................................

..............................................................................................................

2. ..............................................................................................................

..............................................................................................................

3. ..............................................................................................................

..............................................................................................................

- **පහත සඳහන් ප්‍රශ්න සියල්ලටම අදාළ පිළිතුරු හිස්තැන් මත ලියන්න.**

19. 1. **''හැට නව දහස් දහනවය''** ඉලක්කමෙන් ලියන්න.

..............................................................................................................


2. 9(8)725 රවුම් කළ සංඛ්‍යාවේ ස්ථානීය අගය ලියන්න.


..............................................................................................................

20. පහත සංඛ්‍යා අවරෝහණ පිළිවෙළට ලියන්න.

7685 , 7991 , 7783 - ..........................................................................................


21. පහත රූපයට අදාළ සංඛ්‍යා රෝම සංඛ්‍යාංකයෙන් ලියන්න.

1. 

2. 


...................................... ......................................

22. 1. පහත හැඩතල යොදා ගෙන සෑදිය හැකි ඝන වස්තුව කුමක් ද?




...........................................................

2. මෙහි සමමිතික රේඛා 2 ක් අඳින්න.



23. කවීන් 17km 700m ක දුරක් බසයෙන් ද 4km 500m දුරක් ත්‍රිරෝද රථයෙන් ද ගමන් කළේ ය. ඔහු ගමන් කළ මුළු දුර කොපමණ ද? ..........................................................................................

24. කුමාර ගෙනෙන ලද ගඩොල් කැට සමාන ගොඩවල් 4 ට වෙන් කළේ ය. එක් ගොඩක කැට 493 කි. ගෙනෙන ලද මුළු ගඩොල් ප්‍රමාණය කොපමණ ද? ........................................................

25. 

1. මෙහි පාට නොකළ කොටස භාගයක් ලෙස දක්වන්න. ..................

2. පේර ගෙඩි 36 න් $\frac{3}{4}$ ක් විකුණන ලදී.ඉතිරි පේර ගණන කීයද?............

26. වෙළෙන්දෙක් එක් පොල් වත්තකින් පොල් ගෙඩි 1530 ක් ද තවත් වත්තකින් පොල් ගෙඩි 1476ක් ද මිල දී ගත්තේ ය. ඔහු පොල් වතු දෙකෙන් මිල දී ගත් පොල් ගෙඩි සංඛ්‍යා අතර වෙනස කීයද? ..........................................................................................................................................

27. **කුමාර 18:30 ට පොත් පාඩම් කිරීම ආරම්භ කර 23:00 ට පොත් පාඩම් කිරීම අවසන් කරන ලදී.**

එම වේලාවන් දෙක පැය 12 ඔරලෝසු වේලාවෙන් ලියන්න.

1. 18:30 -....................................... 2. 23:00 - .............................................

28. තල කැරලි 624 ක් එක් අයෙකුට 6 බැගින් කී දෙනෙකුට ලබා දිය හැකි ද? ......................................

29. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | 1kg මිල | | ප්‍රමාණය | වටිනාකම | |
|---|---|---|---|---|---|
| | රුපියල් | සත | | රුපියල් | සත |
| අල | 260 | 00 | 500g | ---------------- | ---------------- |
| බෝංචි | 250 | 00 | 2 kg | ---------------- | ---------------- |
| පරිප්පු | 360 | 00 | 250 g | ---------------- | ---------------- |
| **එකතුව** | | | | ---------------- | ---------------- |

ඉහත බිල්පත සඳහා රු. 1000.00 මුදලක් දුන්නේ නම් ඉතුරු මුදල කීය ද? .............................


30. බෝතල් දෙකක දොඩම් යුෂ 325ml හා 875ml ක් ඇත.

1. බෝතල් දෙකේ ම ඇති මුළු දොඩම් යුෂ ප්‍රමාණය කොපමණ ද?..................*l*.............. *ml*

2. දොඩම් යුෂ පානය 2*l* ක් සෑදීමට ඉහත දොඩම් යුෂ ප්‍රමාණයට ජලය කොපමණ එකතු කළ යුතු ද? ..................................................................................................

3. සාදාගත් දොඩම් බීම *200ml* බැගින් බෝතල් කලේ නම් සාදාගත හැකි බෝතල් ගණන කීය ද? ...............................................................................................................

31. පැයක් තුළ මාර්ගයේ ගමන් කළ වාහන පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක් වේ.




(i) ගමන් කළ පා පැදි සංඛ්‍යාව 9 කි. එය ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

(ii) මාර්ගයේ ගමන් කළ මුළු වාහන ගණන කීය ද?.......................................

✷ **ප්‍රශ්න අංංක 32 සිට 61 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

32. යම් කාර්යයක් නියමිත කාලය තුළ ඉටු කරගත නොහැකි වීමෙන් සිදුවන අවාසියකි,

1. මානසික සහනයක් දැනීම.
2. කාර්යය පිළිවෙළට අවසන් කර ගත නොහැකි වීම
3. කා අතරත් පිළිගැනීමක් ලැබීම

33. අප විසින් අනුගමනය කළ යුතු විරිතක් නොවන්නේ,

1. වැඩිහිටියන් සමඟ එකට එක කතා කිරීම
2. ශබ්ද නගමින් ආහාර ගැනීම
3. වැඩිහිටියන් දුටු විට නැගිටීම

34. ජාතික කොඩියේ කහ පැහැති සිංහ රූපයෙන් නිරූපණය වන්නේ,

1. ජාතික අභිමානය
2. සිංහල ජාතිය නියෝජනය කිරීම
3. ජාතීන් අතර එකමුතු බව

35. රාජ්‍ය ලාංඡනයේ පුන්කලසින් නිරූපණය වන්නේ,

1. සෞභාග්‍යය හා පරිපූර්ණ බව 2. ස්වයංපෝෂිත බව 3. සශ්‍රීකත්වය

36. ශ්‍රී ලංකාවේ උසම කන්ද සහ උසම දිය ඇල්ල පිළිවෙළින්,

1. කිරිගල්පොත්ත සහ බඹරකන්ද
2. බඹරකන්ද සහ දියලුම
3. පිදුරුතලාගල සහ බඹරකන්ද


37. ශ්‍රී ලංකාවේ ආරම්භ වූ පළමු අධිවේගී මාර්ගය කුමක් ද?

1. කටුනායක අධිවේගී මාර්ගය
2. දක්ෂිණ අධිවේගී මාර්ගය
3. කොළඹ - නුවර අධිවේගී මාර්ගය

38. වායව පරිසරයේ වෙසෙන සතුන් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. මී මැස්සා , සමනලයා, කුරුල්ලා
2. මැස්සා, මැක්කා, ලේනා
3. කුරුල්ලා, මාළුවා,අලියා

39. ආලෝකය වැඩි කුමන ඇටවුමේ ද?



A B C

1. **A** 2. **B** 3. **C**

40. සන්නිවේදනයක් සිදුවීමට අංග තුනක් අත්‍යවශ්‍ය වේ. ඒවා නම්,

1. යවන්නා, ලියුම , ලියන්නා
2. ලියුම ලියන්නා, ලියුම , ලියුම ලබන්නා
3. මාධ්‍යය, යවන්නා , ලබන්නා

41. පළමු ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාලය තෙක් නිදහස් අධ්‍යාපනය නොමිලේ ලබා දීම සඳහා කටයුතු කළ වීරවරයෙකි,

1. එස්. මහින්ද හිමි
2. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා.
3. ආතර් සී. ක්ලාක් මැතිතුමා

42. ගෙවත්තේ බෝග පැළ අතර දාස්පෙතියා ශාක වගා කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

1. ගෙවත්තට අලංකාරයක් එක් කිරීමයි.
2. බෝගවලට හානි පමුණුවන සතුන් පළවා හැරීම
3. ගෙවත්තෙහි ඉඩකඩ උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම

43. පුවක්, වරකා, හොර , යන බීජ ව්‍යාප්තිය සිදුවන පිළිවෙළ වන්නේ,

**1.** සතුන් , ජලය , සුළඟ

2. ජලය , සතුන් , සුළඟ

3. පිපිරීම , සතුන් , ජලය

44. ශරීරය වර්ධනය කරන ආහාර කාණ්ඩයට අයත් වේ

**1.** බත්, කිරි , ගොටුකොළ 2. මස් , මාළු , කිරි 3. කවුපි, පාන්, බත්

45. මහා ශිවරාත්‍රිය සහ හජ්ජි උත්සවය සමරණ ආගමික බැතිමතුන් පිළිවෙළින් ,


1. ඉස්ලාම් සහ හින්දු බැතිමතුන්


2. හින්දු සහ ඉස්ලාම් බැතිමතුන්

3. බෞද්ධ සහ කතෝලික බැතිමතුන්


46. සිදුරු කැමරාවකින් බැලූ විට ගසක් පෙනෙන නිවැරදි ආකාරය වන්නේ,

1. 

2. 

3. 

47.




ඉහත සඳහන් ආකාරයෙන් කරන ලද ක්‍රියාකාරකම තුළින් ඔබ හඳුනාගන්නේ,

1. ජලයේ පවතින වර්ණ පිළිබඳව

2. හිරු එළියේ පවතින වර්ණ පිළිබඳව

3. කණ්ණාඩිය තුළින් දිස්වන ආලෝකය

48. 

පහත රූපයේ දැක්වෙන උදාර චරිතය වන්නේ,

1. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මැතිතුමා

2. ආචාර්ය ටී.බී. ජයා මැතිතුමා

3. සි.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා


49. පාවහන් ගලවා නිවසට ඇතුළුවීම යහපත් පුරුද්දක් වන්නේ.

1. පාවහන් ඉවත් කිරීම නිසා පාදවලට පහසුවක් දැනීම

2. පාවහන්වල ඇති විෂ බීජ නිවස තුළට ඇතුළු වීම වැළකෙන නිසා

3. පසු දිනට පාවහන් සොයා ගැනීමට පහසු වීම නිසා

50. පහත දැක්වෙන චුම්භක එකිනෙකට ආකර්ෂණය නොවන අවස්ථාව තෝරන්න.

1.  2.  3. 

51. බීම වර්ග සාදා ගැනීමට යොදා ගත හැකි දේවල් වන්නේ,

1. වෙරළු, කැකිරි 2. ගොටුකොළ, හාතාවාරිය 3. බෙලිමල්, රණවරා

52. දඬු හා මුල් මගින් පැළ ලබා ගත හැකි ශාක වන්නේ

1. බුලත් හා නිවිති  2. අඹ හා දෙහි  3. නිවිති හා දෙල්

53. පීරිසියකට ලුණු වතුර දමා තද අව්වේ තැබූ විට අවසානයේ දැකිය හැක්කේ,

**1.** වතුර සහිත පීරිසිය  2. හිස් පීරිසිය  3. ලුණු සහිත පීරිසිය

54. වගාවට හානි කරන කුරුල්ලන් හා වෙනත් සතුන් පලවා හැරීමට භාවිතා කරන  ඇටවුමකි,

1. බඹර රෝදය  2. ජල රෝදය  3. සුළං ටකය

55. ශ්‍රී ලංකාවේ මුල්ම වැව හා සෑදූ රජු වන්නේ,

1. බසවක්කුලම , පණ්ඩුකාභය රජ
2. අභය වැව , දුටුගැමුණු රජු
3. මින්නේරිය වැව , මහසෙන් රජ

56. අයිස් කැට ප්‍රායෝගිකය යොදා ගන්නා අවස්ථාවකි,

1. පලා වර්ගවල නැවුම් බව රැක ගැනීමට
2. මාළු නරක් නොවී කල්තබා ගැනීමට
3. වියළි ආහාර ද්‍රව්‍ය නරක් නොවී තබා ගැනීමට

57. අනාරක්ෂිත ස්ථානයක් හා අනාරක්ෂිත අවස්ථාවක් පිළිවෙළින්,

1. නයෙක් සිටින තුඹසක් සහ පයින් ගමන් කරන අය පාරේ වම්පසින් යාම
2. නාය යන ස්ථානයක් හා නයෙක් සිටින තුඹසක්
3. රතිඤ්ඤා පත්තු කිරීම හා පාරේ දකුණින් ගමන් කිරීම.

58. මෙම ඇටවුමට චුම්බක ශක්තිය වැඩි කිරීමට කළ හැකි දෙයකි.




1. වියළි කෝෂ ගණන අඩු කිරීම
2. කොයිල් කම්බි ඔතන ප්‍රමාණය වැඩි කිරීම
3. කොයිල් කම්බි ඔතන ප්‍රමාණය අඩු කිරීම

59. ජල රෝදයේ කරකැවීමේ වේගය වැඩි කිරීමට කළ හැකි දෙයකි,

1. ජල පහරේ වේගය වැඩි කිරීම
2. ජල පහරේ වේගය අඩු කිරීම
3. ජල රෝදයේ පෙති ගණන අඩු කිරීම

60. මෙම පරීක්ෂණයෙන් පැහැදිලි වන්නේ,



1. චුම්භකවල ලෝහ ආකර්ෂණය
2. චුම්භකවල ලෝහ විකර්ෂණය
3. චුම්භකවල ආකර්ෂණය හා විකර්ෂණය

61. අතීතයේ ජීවත් වූ මිනිසා සන්නිවේදනය සඳහා යොදාගත් ක්‍රම ඇතුළත් වන්නේ,

**1.** කොඩි එසවීම, දුරකථන මගින්, පරිගණක මගින්

**2.** ශබ්දවාහිනී, කටින් කට , ගිනිමැල ගැසීම

**3.** කොඩි එසවීම, කටින් කට , සතුන් මගින්